# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2486/08 – 2026 අප්‍රේල් මස 28 වැනි අඟහරුවාදා – 2026.04.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


## I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

### රජයේ නිවේදන

මගේ අංකය: IR/COM/02/2023/234

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.08.05 දිනැති හා අංක 2448/20 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.07.31 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 03, බාලා තම්පෝ පටුමඟ, අංක 03 හි පිහිටි ලංකා වෙළෙඳ කාර්මික සහ පොදු කම්කරු සංගමය (සීඑම්යූ) සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කටුනායක, අපනයන සැකසුම් කලාපය (EPZ), වටරවුම් පාර 01 හි පිහිටි සී/ස ෂෝ වු ෂෝ පුද්ගලික සමාගම අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 63/2025 හා 2026.02.28 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

1A – G 046712 – 24 (2026/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**බේරුම්කර හා කාර්මික අධිකරණ ශාඛාව**

යොමු අංකය - IR/COM/02/2023/234
නඩු අංකය - A/63/2025

ලංකා වෙළෙඳ, කාර්මික සහ පොදු කම්කරු සංගමය,
(සීඑම්යූ), අංක 03,
බාලා තම්පෝ පටුමග,
කොළඹ 03.

*පළමු පාර්ශ්වය*

එදිරිව

සී/ස ෂෝ ටු ෂෝ පුද්ගලික සමාගම,
වටරවුම් පාර 01,
අපනයන සැකසුම් කලාපය (EPZ),
කටුනායක.

*දෙවන පාර්ශ්වය*

**ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, උක්ත ආරාවුල බේරුම්කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2025.07.31 වන දින නියෝගය මගින් බේරුම්කරුවෙකු වශයෙන් මා පත්කර මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවතින කරුණු වනුයේ:

සී/ස ෂෝ ටු ෂෝ සමාගමේ සේවය කරන එස්. ජී. සමන්ත හෙලකුමාර මහතාට මාසිකව ගෙවනු ලැබූ රු. 5000/- ක අමතර දීමනාව 2022 පෙබරවාරි මාසයේ සිට අහිමි කිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී තිබේ ද යන්නත්, එසේ අසාධාරණයක් සිදු වී තිබේ නම්, ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ.

**පෙනී සිටීම සහ බේරුම්කරණ විභාග පටිපාටිය.**

මෙම පරීක්ෂණය 2025.09.08 දින මුල් වරට කැඳවන ලද දිනයේ සිට විභාගය අවසන් කරන කාලය තුළ දෙපාර්ශ්වයම ඒ සඳහා සහභාගී විය.

**පරීක්ෂණය**

මෙම බේරුම්කරණය 2025.09.08 වන දින ආරම්භ කරන ලද අතර එදින දෙපාර්ශ්වයම ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කරන ලද අතර, සාමදානයෙන් සමථ කිරීමට උත්සාහ කරන ලද නමුත්, ඒ සඳහා දෙපාර්ශ්වයේ එකඟතාවයක් නොවූ බැවින් ලිඛිත සාක්ෂි මෙන්ම වාචික සාක්ෂි ලබා ගන්නා ලදී. ඒ අනුව පළමු සැසිය 2025.09.08 දිනත්, දෙවන සැසිය 2025.10.16 දිනත්, තෙවන සැසිය 2025.11.11 දිනත්, හතර වන සැසිය 2026.01.07 දිනත් වශයෙන් පවත්වා අවසන් කරන ලදී.

2025.09.08 දින පළමු පාර්ශ්වය ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කරමින් සඳහන් කර ඇත්තේ උක්ත සේවකයා ගබඩා සහකරුවෙකු ලෙස 2007.08.29 දින සේවයට බැදී ඇති බවත්, මොහු සේවයට බැඳුණු අවස්ථාවේ දී ගබඩා අංශය භාරව සිටි ගබඩා භාරකරුවෙකු 2018 වසර මැද භාගයේ දී පමණ ඉවත්ව ගොස් ඇති අතර, මෙතෙක් එම පුරප්පාඩුව පුරවා නොමැති බවත්,

2019 මාර්තු මාසයේදී ආයතනයේ අධ්‍යක්ෂ ජොනී ප්‍රනාන්දු මහතා එම සේවකයා ඔහුගේ කාර්යාලයට කැඳවා ගබඩාවේ කටයුතු නිසියාකාරව පවත්වා ගෙන යාම සඳහා සහාය දෙන ලෙසත්, ඒ සඳහා රු. 5000/- ක මුදලක් මාසික දීමනාවක් ලෙස ඔහුගේ වැටුපට අමතරව ඔහුට ගෙවනු ලබන බව ප්‍රකාශ කළ බවත්,

ඒ අනුව 2019 අප්‍රේල් මස සිට 2022 ජනවාරි මස දක්වා අදාළ දීමනාව සෑම මාසයකම අඛණ්ඩව සේවක මහතාට ගෙවූ බවත්,

මෙම දීමනාව ලබා දීමේදී, මෙය තාවකාලික බව හෝ විනය හේතුන් මත දඬුවමක් වශයෙන් කපා හරින බව හෝ නිශ්චිත කාල සීමාවක් සඳහා ගෙවන ලද එකක් බව හෝ පාලනාධිකාරියේ අභිමතය පරිදි කපා හරින බව හෝ සේවකයාට වාචිකව හෝ ලිඛිතව දන්වා නොමැති බවත්,

මෙම රු. 5000/- ක අමතර දීමනාව ලබා දීමේ පදනම මත එම රාජකාරියේ යෙදීමට සේවකයා කැමැත්ත පළ කර ඒ අයුරින් සේවයේ යෙදුණු බවත්,

2022 පෙබරවාරි මස සිට ඉහත දීමනාව කිසිදු දැනුම් දීමකින් තොරව සමාගම විසින් නවතා ඇති බවත්,

2018 වසර වන විට ආසන්න වශයෙන් නිලධාරීන්ද ඇතුළුව සේවකයින් 10 දෙනෙකු පමණ සේවයේ යෙදුණු ගබඩා අංශයේ මේ වන විට සේවය කරනු ලබන්නේ අදාළ සේවකයා සහ තවත් එක් ලිපිකාරිණියක් පමණක් බවත්,

ගබඩාවේ නිෂ්පාදන කටයුතු බාධාවකින් තොරව සේවකයා විසින් පවත්වා ගෙන යනු ලබන බවත්, එසේ නොකරන බවට කිසිදු චෝදනාවක් ලිඛිතව හෝ වාචිකව මෙතෙක් ආයතනය වෙත සිදු කර නොමැති බවත්,

ඉහත සඳහන් දීමනාව කපා හැරීම පිළිබඳව 2022.03.21, 2022.04.23, 2022.05.18, 2022.06.16, 2022.08.16, 2022.09.21, 2022.12.12, 2022.02.23 දිනැති ලිපි මගින් සේවකයා විසින් අදාළ දීමනාව සහ හිඟ මුදල් ගෙවන ලෙස ඉල්ලීම් කළද, ඒ සඳහා කිසිදු ප්‍රතිචාරයක් මෙතෙක් ලබාදී නොමැති බවත්,

මෙම සේවකයාට **සේවාවක් ඉටු කිරීම** වෙනුවෙන් පිරිනමන ලද මෙම දීමනාව, එය නතර කළ දින සිට සම්පූර්ණ හිඟ මුදල් ද සමග නැවත ස්ථාපිත කිරීම හා ඉදිරියට පවත්වා ගෙන යන ලෙස ඉල්ලා සිටී.

**2025.09.08 වන දින වගඋත්තරකාර දෙවන පාර්ශ්වය විසින් මූලික කරුණු දක්වමින් මෙසේ සඳහන් කරයි.**

මෙම දීමනාව 2022 පෙබරවාරි මස සිට **සානුකම්පිත දීමනාවක් වශයෙන්** ලබා දෙන රු. 5000/- ක දීමනාවක් බවත්,

කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව යොමු කර ඇති බේරුම්කරණය, ඒ සඳහා යොමු කිරීමට සුදුසු කාර්මික ආරාවුලක් උපවය වී නොමැති බවත්,

**මූලික විරෝධතාවයක්** වශයෙන්, අංක DCL/WP3/1/5/1-II/ 46/23 යටතේ පවත්වන ලද විභාගයෙන් අනතුරුව ගම්පහ නියෝජ්‍ය කම්කරු කොමසාරිස් බී. ජී. පී. එන්. දිල්ශාරි මහත්මිය විසින් පළමු පාර්ශ්ව සංගමය වෙත පමණක් 2023.09.18 දිනැතිව ලිපියක් යවමින් ප්‍රශ්නගත රු. 5000/- ක මුදල මාසික ඉපයීමක් වශයෙන් අර්ථ කථනය කළ නොහැකි බව තහවුරු වන බව දක්වා ඇති බවත්,

ඒ අනුව DCL/WP3/1/5/1-11/46/23 පැමිණිලි විභාගය සඳහා 2023.09.18 දිනැති ලිපිය මගින් ගම්පහ නියෝජ්‍ය කම්කරු කොමසාරිස්, බී. ජී. පී. එන්. දිල්ශාරි මහත්මිය විසින් සිය තීරණය ලබා දී ඇති බවත්,

කරුණු එසේ තිබියදී, 2023.11.14 දිනැති ලිපියක් මගින් උක්ත තීරණය අභිබවා යමින් පැමිණිලි විභාගය බේරුම්කරණය සඳහා සළකා බැලීම සඳහා යොමු කර ඇති බවත්,

ඒ අනුව තීරණයක් ලබා දී අවසන් කරන ලද පැමිණිලි ගොණුවක් නැවත විවෘත කළ හැකි බව කාර්මික ආරාවුල් පනතේ සඳහන් නොවන බවත්,

මේ සම්බන්ධයෙන් පවතින නීතිමය තත්ත්වය **බ්‍රවුන් සහ සමාගම එදිරිව කම්කරු කොමසාරිස් ජනරාල් සහ තවත් අය** යන නඩු තීන්දුවේ දක්වා ඇති බවත්,

මෙම නඩු තීන්දුව 1983 අංක 12 දරන පාරිතෝෂික දීමනා ගෙවීම් පනතේ පැමිණිලි විභාගයක් සම්බන්ධයෙන් ලබා දී ඇතත්, ඒ පනත හා සමානවම කාර්මික ආරාවුල් පනතේද තීරණයක් ලබා දී අවසන් කරන ලද පැමිණිලි ගොණුවක් නැවත විවෘත කළ නොහැකි බව සඳහන් වන බැවින්, එකී නඩු තීන්දුවේ හරය එලෙසින්ම අදාළ වන බවත්,

ඒ අනුව මෙකී පැමිණිලි විභාගය නීතිමය වශයෙන් දෝෂ සහිත වන බැවින් ඉදිරියට පවත්වා ගෙන යාම සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය සිය විරෝධතාවය දක්වන බවත්,

**එම විරෝධතාවට අගතියක් නොවන පරිදි,**

සේවකයා 2007 අගෝස්තු 29 දින සහකාර ගබඩා භාරකරුවෙකු ලෙස සේවයට බැඳී ඇති බවත්,

සේවකයා මෙම වසර ගණනාව තුළ ම බොහෝ දිනවල සේවයට වාර්තා කර නොමැති බවත්, ඒ සම්බන්ධයෙන් ඔහුට අවවාදාත්මක ලිපි නිකුත් කර ඇති බවත්,

**සානුකම්පිත දීමනාවක් වශයෙන් ලබා දෙන රු. 5000/- ක දීමනාව නොගෙවීම**

මෙම සේවකයා දිගින් දිගටම ප්‍රමාද වී සේවයට වාර්තා කිරීම හා සමහර දිනවල දෙවන පාර්ශ්වයට නොදන්වා වැඩට වාර්තා නොකිරීම යන කරුණු පදනම් කරගෙන 2022 පෙබරවාරි මස සිට සානුකම්පිත දීමනාවක් වශයෙන් ලබා දෙන රු. 5000/- දීමනාව සේවකයාගේ ක්‍රියා කලාපය මත තවදුරටත් ලබා දීමට දෙවන පාර්ශ්වයට හැකියාවක් නොමැති බවත්,

තවද, සේවකයා නොයෙකුත් විනය විරෝධී ක්‍රියාවන් හි යෙදී ඇති බවත්,

සේවකයා 2007 සිට 2019 දක්වා සහකාර ගබඩා භාරකරු ලෙස ක්‍රියා කළද, එම ගබඩාවේ ඇති භාණ්ඩ සම්බන්ධයෙන් නිසි දැනුමක් නොමැති බවත්,

සමාගමේ අභිමතානුසාරී බලය අනුව ලබා දෙන එකී **සානුකම්පිත දීමනාව** කිසිසේත් මූලික වැටුපේ කොටසක් නොවන අතර සේවකයාගේ ක්‍රියා කලාපය පදනම් කරගනිමින් **සානුකම්පිත දීමනාවක්** වශයෙන් ලබා දෙන රු. 5000/- ක දීමනාව 2022 පෙබරවාරි මස සිට කපා හැරීමට දෙවන පාර්ශ්වයට නිත්‍යානුකූල අයිතියක් ඇති බව සනාථ වන බවත්,

තවද සේවකයාගේ අඛණ්ඩ විනය විරෝධී සහ දෙවන පාර්ශ්වයට අහිත කර ක්‍රියා කලාපය නොසළකා හැර එකී **සානුකම්පිත** ගෙවීම සිදු කළ හොත් එය අනිකුත් සේවකයින් වෙත වැරදි පූර්වාදර්ශයක් ලබා දෙන බවත්,

බේරුම්කරණ යොමු කිරීමේ සඳහන් පරිදි සහන ලබා දීමට නීතිමය ප්‍රතිපාදන නොමැති බවත්.

**2025.10.16 දින පළමු පාර්ශ්වයේ දෙවන ලිඛිත ප්‍රකාශය මගින්;**

දෙවන පාර්ශ්වයේ අංක 1 යටතේ දක්වා ඇති කරුණ බේරුම්කරණය නොමග යවන සුළු වශයෙන් දක්වා ඇති බවත්,

අංක 3 යටතේ දක්වා ඇති කරුණු වැරදි සහගත වන අතර, කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ කම්කරු අමාත්‍ය විසින් නිවැරදිව, බේරුම්කරණය වෙත යොමු කර ඇති අතර, මෙය ඒ අයුරින් යොමු කිරීමට උපචය වූ ආරාවුලක් බවත්,

අංක 4 යටතේ සඳහන් කරුණු වලට අදාළව, පළමු පාර්ශ්වය වෙත ගම්පහ සහකාර කොමසාරිස් විසින් එවා තිබූ 2023.09.18 වන දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ ඇයගේ තීන්දුව නොව, මෙම ආරාවුල පිළිබඳ ඇයගේ අදහසක් පමණක් බවත්,

ඇයගේ ඉහත ලිපිය මගින් දන්වා තිබූ අදහස හෝ නිගමනය දෙවන පාර්ශ්වය වෙත දන්වා නොතිබුණු බවත්,

ඇයගේ නිගමනය වැරදි සහගත බව පෙන්වා දෙමින්, පළමු පාර්ශ්වය විසින් 2023.10.18 වන දින ලිපිය මගින් කරුණු පැහැදිලි කර ඇති බවත්,

පළමු පාර්ශ්වය විසින් ඉහත ලිපිය මගින් දක්වා තිබූ කරුණු සැලකිල්ලට ගනිමින් ගම්පහ, සහකාර කම්කරු කොමසාරිස් විසින් 2023.11.14 දිනැති ලිපිය මගින් අදාළ ලිපි ගොනුව කාර්මික සබඳතා අංශය වෙත කාර්මික ආරාවුල් පනතේ 4(1) යටතේ කටයුතු කිරීම සඳහා යොමු කර තිබුණ බවත්,

එම යොමු කිරීම සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය වෙත ද දන්වා තිබූ නමුත්, ඒ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය කිසිදු විරෝධතාවයක් ප්‍රකාශ කර නොතිබුණ බවත්,

දෙවන පාර්ශ්වයේ ලිඛිත ප්‍රකාශයේ අංක 14 යටතේ දක්වා ඇති **"සානුකම්පිත දීමනාවක් "Ex Gratia** ගෙවීමක් මෙම ආරාවුලට අදාළ නොවන බවත්,

මෙම ගෙවීම සානුකම්පිත දීමනාවක් හෝ Ex Gratia ගෙවීමක් බව ගෙවීම ආරම්භ කරන ලද අවස්ථාවේදී හෝ ආරාවුල මතු කරන්නට පෙර කිසිදු අවස්ථාවකදී හෝ සමාගම විසින් අදාළ සේවකයාට දන්වා නැති බවත්,

සානුකම්පිත හෝ Ex Gratia ගෙවීමක් එක් සේවකයෙකුට පමණක් ලබා දීමට හෝ එය අවලංගු කිරීමට හෝ සමාගමේ ආයතනික සංග්‍රහයේ හෝ සමාගමේ ගිණුම් ප්‍රතිපත්ති වල හෝ සදහන්ව ඇති බව සමාගම විසින් කිසිදු අවස්ථාවකදී ඔප්පු කර නැති බවත්,

මෙම දීමනාව මූලික වැටුපට එකතු නොකර, වැටුප් පත්‍රිකාවේ හෝ සඳහන් නොකර ගෙවා ඇත්තේ, මෙම ගෙවීමට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් වලින් වැළකී සිටීමට බව පැහැදිලි වන බවත්,ය.

**2025.12.08 වන දින වගඋත්තරකාර සමාගම විසින් වැඩිදුර ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කරමින් මෙසේ සඳහන් කරයි.**

**A ප්‍රශ්නගත දීමනාව දෙවන පාර්ශ්වයේ ව්‍යවස්ථාපිත හා /හෝ ගිවිසුම් ගත වගකීමක් (Neither Statutory or Contractual Responsibility) නොවේ.**

තවදුරටත් මෙසේ සඳහන් කර ඇත.

වර්ෂ 2019 මැයි මස 03 වන දිනැති ලිපිය මගින් වර්ෂ 2019.05.01 සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයාගේ තනතුර ගබඩා සහය විධායක තත්ත්වය දක්වා ඉහළ නංවා ඇත. නමුත් එම අවස්ථාවේ වැටුප් වර්ධකයක් ලබා නොදෙන බව පැහැදිලිවම සේවකයා වෙත දෙවන පාර්ශ්වය විසින් ලිඛිතව දන්වා ඇත.

මෙම අවස්ථාවේදී දෙවන පාර්ශ්වය විසින් සිය කළමනාකාරිත්වයේ අභිමතානුසාරී බලය මත පදනම්ව සේවකයා වෙත රු. 5000/- ක දීමනාවක් ලබා දී ඇත. **විශේෂයෙන් සේවකයාට ගබඩාවේ තම සේවයේ කටයුතු නිසි ලෙස කිරීමට මෙම රු. 5000/- ක අනියම් දීමනාවක් ලබා දීමට කළමණාකාරිත්වය උත්සුක වී ඇත. ඒ බව සේවකයා වෙත වාචිකව දැනුම් දීමක් පමණක් සිදු කර ඇත.**

විශේෂයෙන් සඳහන් කළ යුත්තේ එම දීමනාව වෙනත් කිසිදු සේවකයකුට ලබා නොදුන් සහ මෙම ආරාවුලේ සේවකයාට පමණක් ලබා දුන් දීමනාවක් බවත්,

ඒ අනුව ප්‍රශ්න ගත දීමනාව කිසිසේත් ම දෙවන පාර්ශ්වයේ ව්‍යවස්ථාපිත හා /හෝ ගිවිසුම් ගත වගකීමක් නොවන බවත්,

**B. ප්‍රශ්ණගත දීමනාව ලැබීම සඳහා නුසුදුසු බව දෙවන පාර්ශ්වයට තීරණය කිරීමට හැකි බවත්,**

ඒ සම්බන්ධයෙන් දෙවන පාර්ශ්වය විසින් පහත කරුණු ඉදිරිපත් කරයි;

සේවකයාගේ 2007 අගෝස්තු මස 29 දිනැති සේවා ගිවිසුමේ සේවකයාට ගෙවනු ලබන වැටුප් වැඩි කිරීම් ස්වයංක්‍රීය ඒවා නොව සේවකයාගේ ප්‍රශස්ත සේවය සළකා ඔහු විසින් උපයා ගත යුතු ඒවා වන බවත්,

සේවකයාගේ තනතුර ඉහළ නැංවුවද, මෙම සේවකයා මුල් අවස්ථාවේ සිට කරන ලද ප්‍රමාද වී සේවයට වාර්තා කිරීම ඇතුළුව තවත් විෂමාචාර/විනය විරෝධී ක්‍රියා දිගින් දිගටම සිදු කර ඇති අතර දෙවන පාර්ශ්වය විසින් සේවකයා හට දිගින් දිගටම අවවාදාත්මක ලිපි නිකුත් කර ඇති බවත්,

ප්‍රශ්නගත දීමනාව සේවකයා වෙත ගෙවීමට තීරණය කරනු ලබන්නේ කළමනාකරණ අධ්‍යක්ෂවරයා විසින් වන අතර, එකී ගෙවීම සේවකයා විසින් ගබඩාව සම්බන්ධයෙන් සිදු කරන සේවාවන් කේන්ද්‍ර කොට ගනිමින් අතිරික්තව ගෙවීමට තීරණය කර ඇති ගෙවීමකි.

සේවකයාගේ පිළිගත නොහැකි හැසිරීම හා දුර්වල සේවය මත පදනම්ව දෙවන පාර්ශ්වය විසින් ලබා දෙන ලද රු. 5000/- ක දීමනාව වර්ෂ 2022 පෙබරවාරි මස හෝ ඊට ආසන්න දිනක සිට නැවැත්වීමට කටයුතු කර ඇති බවත්, ය.

**දෙපාර්ශ්වයේ දක්වා ඇති කරුණු අනුව බේරුම්කරණ ඉදිරියේ විසඳිය යුතු යැයි හඳුනා ගත් ප්‍රශ්ණ;**

**1 පළමු පාර්ශ්වයට ලබා දුන් මෙම දීමනාව “ සානුකම්පිත දීමනාවක් ” ද ?**

සානුකම්පිත දීමනාවක් ගෙවනු ලබන්නේ රැකියා අවසන් කරන වැනි අවස්ථාවකදී එක් වරක් පමණක් ගෙවන දීමනාවක් ලෙස ය. මාසිකව ලබා දෙන දීමනාවක් සානුකම්පිත දීමනාවක් වශයෙන් සැලකිය නොහැක.

තවද, 2025.12.08 දින දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද සැළ කිරීම් හි 7 සහ 8 ඡේදයන්හි සඳහන් කර ඇත්තේ වර්ෂ 2019 මැයි මස සිට සේවකයාගේ තනතුර ගබඩා සහය විධායක දක්වා ඉහළ නංවා ඇති බවත්, විශේෂයෙන් සේවකයාට ගබඩාවේ තම සේවයේ කටයුතු නිසි ලෙස කිරීමට මෙම රු. 5000 අනියම් දීමනාවක් ලබාදීමට කළමනාකාරිත්වය උත්සුක වී ඇති බවත්ය.

ඒ අනුව දෙවන පාර්ශ්වයේ කරුණු දැක්වීම අනුවම මෙම දීමනාව සානුකම්පිත දීමනාවක් නොවන බවයි.

**2. එසේ නම් මෙම දීමනාව ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම් ගත වගකීමක් නොවන්නේද?**

දෙවන පාර්ශ්වයේ ඉහත සඳහන් කළ ලිඛිත සැළකිරීම් හි සඳහන් කර ඇත්තේ දෙවැනි පාර්ශ්වය විසින් සිය කළමනාකාරිත්වයේ අභිමතය මත, විශේෂයෙන් සේවකයාට ගබඩාවේ තම සේවයේ කටයුතු නිසි ලෙස කිරීමට මෙම රු. 5000/- අනියම් දීමනාවක් ලබා දීමට කළමනාකාරිත්වය උත්සුක වී ඇති බවත්, **ඒ බව සේවකයා වෙත දැනුම් දීම වාචිකව පමණක් සිදු කර ඇති බවත් ය.**

නෛතික වශයෙන් ගිවිසුමක් ඇති වීම සඳහා සපුරාලිය යුතු අංග කවරේද?

- i අර්පණය (offer)
- ii ප්‍රතිග්‍රහණය (acceptance)
- iii නෛතික සම්බන්ධතා ඇති කිරීමේ චේතනාව
- iv සාධාරණ හේතුවක් හෝ අගනා ප්‍රතිෂ්ඨාවක් තිබීම
- v ගිවිසුම නිත්‍යානුකූල වීම
- vi ගිවිසුමේ පාර්ශ්වකරුවන් ගිවිසුම් සඳහා ශක්නුතාවයකින් යුක්ත වීම.
- vii ගිවිසුම ක්‍රියාත්මක කිරීමට ඇති හැකියාව

මෙම දීමනාව ලබා දීමේදී ඉහත සඳහන් කළ සියලු කරුණු සම්පූර්ණ වී ඇති බව සනාථ වේ.

දෙවන පාර්ශ්වය විසින්ම දක්වා ඇති පරිදි 2019 මැයි මස 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සේවකයාගේ තනතුර ගබඩා සහය විධායක තත්ත්වය දක්වා ඉහළ නංවා ඇති නමුත් එම අවස්ථාවේ දී වැටුප් වර්ධකයක් නොදී ඒ වෙනුවට, ගබඩාවේ කටයුතු නිසියාකාරව පවත්වා ගෙන යාම සඳහා මෙම දීමනාව ලබා දී ඒ බව වාචිකව දැනුම් දී ඇති බවත්, සේවකයා එය පිළිගෙන ඒ අනුව කටයුතු කර ඇති බවත්, ඒ අනුව මෙම දීමනාව ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම් ගත වගකීමක් බවට පත් වී ඇති බව සනාථ වේ.

මෙම දීමනාව ගෙවීම සඳහා තවත් හේතුවක් වී ඇත්තේ මොහු සේවයට බැඳුණු අවස්ථාවේ දී සිටි ගබඩා භාරකරුවකු ඉවත්ව ගොස් ඇති අතර, අද දින තෙක් එම තනතුර පුරප්පාඩුව ඇති නිසාත්, එම කාර්යය ඉටු කිරීමට සේවකයා වෙත පැවරී ඇති නිසාත්ය.

එම නිසා මෙම දීමනාව සානුකම්පිත දීමනාවක් නොවන බවත්, ව්‍යවස්ථාපිත/ ගිවිසුම්ගත වගකීමක් ලෙස නිගමනය කරමි.

**3. මෙම නඩුකරය නියෝජ්‍ය කම්කරු කොමසාරිස් විසින් තීරණයක් ලබා දී ඇති අවසන් කරන ලද ආරාවුලක්ද?**

කාර්මික ආරාවුල් පනතේ 11 සහ 12 වගන්තීන්හි කාර්මික ආරාවුලක් සාමදානයෙන් නිරවුල් කිරීම පිළිබඳව කොමසාරිස් තැනට හෝ බලය ලත් නිලධාරියෙකුට ඇති යුතුකම් හා බල තල දක්වා ඇත.

12 (1) වගන්තිය ප්‍රකාරව කොමසාරිස් තැනට හෝ බලය ලත් නිලධාරියෙකුට හෝ කාර්මික ආරාවුලක් නිරවුල් කිරීමට පුළුවන් වී නම්, ආරාවුලට සම්බන්ධ වූ දෙපාර්ශ්වයම හෝ නියෝජිතයන් හෝ අත්සන් කළ යුතු වේ.

මෙහිදී සිදු වී ඇත්තේ ගම්පහ සහකාර කම්කරු කොමසාරිස් විසින් 2023 සැප්තැම්බර් මස 18 වන දිනැති ලිපිය මගින් දන්වා ඇත්තේ ඇයගේ තීන්දුව නොව මෙම ආරාවුල සම්බන්ධයෙන් ඇයගේ අදහසක් පමණක් බව සනාථ වේ.

ඇයගේ ඉහත අදහස හෝ නිගමනය දෙවන පාර්ශ්වය වෙත දන්වා නොතිබුණු අතර, ඇයගේ මෙම නිගමනය වැරදි සහගත බව පෙන්වා දෙමින් පළමු පාර්ශ්වය විසින් 2023 ඔක්තෝබර් මස 18 දින ඇය වෙත දන්වා ඇති බවද සනාථ වේ.

ඒ අනුව මෙම ආරාවුල කාර්මික ආරාවුල් පනතේ ඉහත කී විධිවිධාන අනුව තීරණය කර අවසන් වූ ආරාවුලක් නොවන බව සනාථ වේ.

එබැවින් දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන බ්‍රවුන් සහ සමාගම එදිරිව කම්කරු කොමසාරිස් ජනරාල් නඩු තීන්දුවේ නීතිමය තත්ත්වය මෙම බේරුම්කරණය සඳහා යොදා ගැනීමට නොහැකිය.

**4. කාර්මික ආරාවුල් පනතේ 4(1) අනුව බේරුම්කරණ සඳහා යොමු කිරීමට සුදුසු කාර්මික ආරාවුලක් උපචය වී නොමැතිද?**

මෙම ආරාවුල සම්බන්ධයෙන් අවශ්‍ය පරිදි ක්‍රියා කරන ලෙස උපදෙස් දෙමින්, කම්කරු කොමසාරිස් - කාර්මික සබඳතා විසින් මීගමුව සහකාර කම්කරු කොමසාරිස් වෙත 2022.12.22 දිනැති ලිපිය මගින් යොමු කර ඇති බවත්, මීගමුව සහකාර කම්කරු කොමසාරිස් කාර්යාලයේ පාර්ශ්වයන් අතර සාකච්ඡා පවත්වා ඇති බවත්, එම සාකච්ඡා සහ ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව මෙම ආරාවුල බේරුම්කරණය වෙත යොමු කරන ලෙස නිර්දේශ කර ඇති බවත්,

මේ සම්බන්ධයෙන් කාර්මික සබඳතා අංශයේදී ද සාකච්ඡා වට 02 ක් පවත්වා ඇති බවත්,

ඒ අනුව මෙම ආරාවුල බේරුම්කරණය වෙත යොමු කිරීම සඳහා සහකාර කම්කරු කොමසාරිස් -මීගමුව, සහකාර කම්කරු කොමසාරිස් ගම්පහ සහ කාර්මික සබඳතා අංශය විසින් ක්‍රියා කර ඇති බව සනාථ වේ.

ඒ අනුව මෙම ආරාවුල බේරුම්කරණය සඳහා නිසි පරිදි අදාළ විධිවිධාන ප්‍රකාරව යොමු කර ඇති බව සනාථ වේ.

**5. දෙවන පාර්ශ්වය සඳහන් කරන සේවකයාගේ පිළිගත නොහැකි හැසිරීම හා දුර්වල සේවය මත මෙම දීමනාව ගෙවීම නැවැත්වීමට හැකිද?**

දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන ලද කරුණු අනුව මෙම සේවකයා විසින් නොදන්වා සේවයට නොපැමිණීම, ප්‍රමාද වී සේවයට පැමිණීම වැනි විනය විරෝධී ක්‍රියාවන් සිදු කර ඇති බව සනාථ වේ. ඒ සඳහා ඔහුට එරෙහිව අවවාදාත්මක ලිපි නිකුත් කර ඇති බවත් පැහැදිලි වේ. ඔහුගේ එම ක්‍රියාවන් සම්බන්ධයෙන් විනයානුකූල පියවර ගැනීමට සමාගමට අවස්ථාව තිබුණි. ඒ වෙනුවට සමාගම විසින් සිදු කරන ලද්දේ අවවාදාත්මක ලිපි නිකුත් කිරීම පමණි.

**නිරීක්ෂණ සහ නියෝගය**

ඉහත සඳහන් කරන ලද දෙපාර්ශ්වයේ කරුණු සහ මතු වූ විසඳිය යුතු ප්‍රශ්න සම්බන්ධයෙන් කරුණු විශ්ලේෂණය කිරීම අනුව පහත සඳහන් කරුණු සනාථ වී ඇත.

1. පළමු පාර්ශ්වයට මෙම දීමනාව ලබා දී ඇත්තේ සානුකම්පිත දීමනාවක් වශයෙන් නොව, මෙම සමාගමෙන් ඉවත් වූ සේවකයා විසින් ඉටු කරන ලද සේවාවන් ඉටුකර ගැනීම සඳහාත්, සේවකයා විසින් මෙම අමතර දීමනාව ලබා දෙන පදනම මත එම රාජකාරි කරමින් සේවය කිරීමට කැමැත්ත පළකර ඒ අයුරින් සේවයේ යෙදී ඇති නිසා එය ගිවිසුම්ගත වගකීමක් බවට පත් වී ඇති බවත්ය.

2. මෙම දීමනාව විනය විරෝධී ක්‍රියාවන් සිදු කරන්නේ නම්, ඒක පාර්ශ්විකව අත්හිටුවන බවට හෝ විනය හේතුන් මත කපා හරින බව කිසිදු අවස්ථාවක දී දෙවන පාර්ශ්වය විසින් පළමු පාර්ශ්වයට දන්වා තිබූ බවක් අනාවරණය නොවූ බවත්,

3. මෙම ආරාවුල මෙයට ප්‍රථම අවසන් තීරණයකට පැමිණි ආරාවුලක් නොවන බවත්, ඒ සම්බන්ධයෙන් තීරණයක් ලබා දීමට මෙම බේරුම්කරණ අධිකරණයට නෛතික හැකියාවක් ඇති බවත්,

4. දෙවන පාර්ශ්වය විසින් ඉදිරිපත් කරන විනය විරෝධී ක්‍රියාවන් සම්බන්ධයෙන් ගත යුතුව තිබූ විධිමත් විනයානුකූල පියවර ගෙන නොමැති බවත්,

5. මෙම දීමනාව, වැටුප් පත්‍රිකාවේ සඳහන් නොකර ගෙවා ඇත්තේ මෙම ගෙවීමට අදාළ ව්‍යවස්ථාපිත ගෙවීම් වලින් වැළකී සිටීමට බව සනාථ වන බවත්,

කරුණු එසේ හෙයින් පහත නියෝගය කරමි.

සී/ස ෂෝ ටු ෂෝ සමාගමේ සේවය කරන එස්. ජී. සමන්ත හෙලකුමාර මහතාට මාසිකව ගෙවනු ලැබූ රු. 5000.00 ක අමතර දීමනාව 2022 පෙබරවාරි මස සිට අහිමි කිරීම මගින් ඔහුට අසාධාරණයක් සිදු වී ඇති බවයි.

ඒ නිසා ඔහුට පහත සඳහන් සහන හිමිවිය යුතු බව ද තීරණය කරමි.

2022 පෙබරවාරි මස සිට 2026 පෙබරවාරි මස දක්වා ගෙවිය යුතු වූ මාසික රු. 5000/- දීමනාව

| | | | | |
|---|---|---|---|---|
| 2022 | - | 11x5000 | = | 55,000 |
| 2023 | - | 12x5000 | = | 60,000 |
| 2024 | - | 12x5000 | = | 60,000 |
| 2025 | - | 12x5000 | = | 60,000 |
| 2026 | - | 02x5000 | = | 10,000 |
| එකතුව. | | | = | 245,000.00 |

ඒ අනුව මෙහි දෙවන පාර්ශ්වය විසින් ඉහත හිඟ මුදල මෙම ප්‍රදානය ගැසට් ගත වී මසක් තුළ මීගමුව දිස්ත්‍රික් කම්කරු කාර්යාලයේ සහකාර කම්කරු කොමසාරිස් වෙත තැන්පත් කළ යුතුය. එමෙන්ම වෙනත් ව්‍යවස්ථාපිත හිමිකම් අයදුම් කිරීමට මෙම ප්‍රදානය කිසිදු බාධාවක් නොවේ.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් බවට තීරණය කරමි

**නීතිඥ සී ඒ එච් එම් විජේරත්න,**
බේරුම්කරු.

2025 පෙබරවාරි මස 28 වැනි දින.
බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාවේ දී ය.

EOG 04 - 0209

---

මගේ අංකය: IR/COM/02/2023/182

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

131 වන අධිකාරය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2025.10.04 දිනැති හා අංක 2456/82 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2025.09.26 දින දරන නියෝගයෙන්, එක්

පාර්ශ්වයක් වශයෙන් කිරම, කරමැටිය, වැතැන්න, ලබුවැලහේන, ''තිළිණ'' හි පදිංචි ඒ.ඩී. ගිහාන් තිළිණ මධුශංක මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් වැලිගම, පැලැන දකුණ, ගාල්ල මාතර පාර, හොටෙල් වැලිගම, මමා රෝමා රෙස්ටුරන්ට් හි පිහිටි ක්‍රිස්ටල් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති අංක A 71/2025 හා 2026.02.16 දිනැති ප්‍රදානය එම පනතේ 18 (1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

**එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,**
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

**බේරුම්කරණ හා කාර්මික අධිකරණ ශාඛාව**

නඩු අංකය - ඒ/71/2025
යොමු අංකය - IR/COM/02/2023/182

ඒ. ඩී. ගිහාන් තිළිණ මධුසංක මයා,
''තිළිණ'',
ලබුවැලහේන,
වැතැන්න,
කරමැටිය,
කිරම.

*පළමු පාර්ශ්වය*

එදිරිව

ක්‍රිස්ටල් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
මමා රෝමා රෙස්ටුරන්ට්,
හොටෙල් වැලිගම,
ගාල්ල මාතර පාර,
පැලැන දකුණ,
වැලිගම.

*දෙවන පාර්ශ්වය*

**බේරුම්කරණ ප්‍රදානය**

කම්කරු අමාත්‍ය ආචාර්ය අනිල් ජයන්ත ප්‍රනාන්දු මහතා විසින් 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමඟ කියවා) දරන පනත් වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා බේරුම්කරු වශයෙන් ගාල්ල, කිතුලම්පිටිය, වේවැල්වල පාර, 10/51 ලිපිනයේ පදිංචි වසන්ත වික්‍රමරත්න පුංචිහේවා වන මා 2025.09.26 වන දින පත් කොට මා වෙත යොමු කර ඇත.

කම්කරු කොමසාරිස් ජනරාල්ගේ IR/COM/02/2023/182 හා 2025.09.17 දිනැති ලිපියෙන් ඉහත පාර්ශ්වයන් අතර ඇති කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වශයෙන් '' ක්‍රිස්ටල් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ් ආයතනයේ සහකාර කෝකිවරයෙකු (Assistant Chef)

ලෙස සේවය කළ ඒ. ඩී. ගිහාන් තිළිණ මධුශංක මහතාට 2023 ජනවාරි මස සේවා ගාස්තුව ලෙස රු.83183/= හිමි බවට සේවායෝජක පිළිගෙන ඇති නමුදු 2023 ජනවාරි මස ඔහු සේවයෙන් ඉවත් වීම හේතුවෙන් සේවායෝජක විසින් එම සේවා ගාස්තුව ඔහුට ලබා නොදීමෙන් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න හා එසේ අසාධාරණයක් සිදුව තිබේ නම් ඔහුට හිමිවිය යුතු සහන කවරේද යන්න පිළිබඳව වේ.” යනුවෙන් යොමුව දක්වා ඇත.

**ප්‍රදානය**

ක්‍රිස්ටල් විලාස් (ප්‍රයිවට්) ලිමිටඩ් හි සහකාර කෝකිවරයෙකු ලෙස සේවය කරන ලද ඒ. ඩී. ගිහාන් මධුශංක මහතා සේවයෙන් ඉවත් වීම හේතුවෙන් 2025 ජනවාරි මාසයට අදාළ රු. 83,183.00 වු සේවා ගාස්තුව ලබා නොදීමෙන් පළමු පාර්ශ්වයට අසාධාරණයක් සිදුවී තිබේද, යන්න පිළිබඳව විභාගයක් පවත්වන ලදි.

නඩු විභාගය 2025.11.24, 2025.12.22 සහ 2026.01.12 යන තෙදින තුලම කැඳවා තිබූ නමුත් පළමු පාර්ශ්වය නොපැමිණීම සම්බන්ධව කිසිදු දැනුම් දීමකින් තොරව විභාගය සඳහා සහභාගි නොවිය.

2026.01.12 දිනට කැඳවීමේ ලිපිය අනුව පළමු පාර්ශ්වයට කරනු ලබන අවසාන දැනුම් දීම බවත් මෙදිනට විභාගය සඳහා දැනුම් දීමකින් තොරව නොපැමිණෙන්නේ නම් විභාගය සඳහා උනන්දුවක් නොමැති සේ සලකා විභාගයේ කටයුතු අවසන් කරන බවත් ලියාපදිංචි තැපැල මගින් දන්වා ඇත.

ඒ අනුව 2026.01.24 දිනැති ලිපිය මගින් නඩු කටයුතු අවසන් කරන බව පළමු පාර්ශ්වයට දැනුම් දී ගොනුවේ කටයුතු අවසන් කර ඇත.

දෙපාර්ශ්වයේම කරුණු සලකා බලා පැමිණිල්ල සම්බන්ධයෙන් තීන්දුවක් ලබාදිය යුතු වුවත් පළමු පාර්ශ්වය නඩුව සඳහා දිගින් දිගටම නොපැමිණීම සහ නොපැමිණීම සම්බන්ධව බේරුම්කරණ අංශය දැනුවත් නොකිරීම මගින් පළමු පාර්ශ්වයට යම් අසාධාරණයක් සිදුව තිබේ ද යන්න සලකා බැලීමට හැකියාවක් නොමැත. ඒ අනුව ගොනුවේ කටයුතු අවසන් කරමි.

මෙම තීරණය සාධාරණ හා යුක්ති සහගත ප්‍රදානයක් බව සහතික කරමි

**ඩබ්. ඩබ්. පුංචිහේවා,**
බේරුම්කරු.

2026 පෙබරවාරි මස 16 වැනි දින දී ය.

EOG 04 - 0210

---

මගේ අංකයː IR/COM/03/2018/183

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරය**

අංක 2455/02 දරන හා 2025.09.22 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ, එක් පාර්ශ්වයක් වශයෙන් මිනුවන්ගොඩ,මාතම්මන, ගම්මැද පාර, අංක 64/5 ඒ ලිපිනයෙහි පදිංචි ඩබ්. ඒ. ඒ.චමින්ද මයා සහ අනෙක් පාර්ශ්වය වශයෙන් කොළඹ 01, චෛත්‍ය පාර, අංක 19 ලිපිනයෙහි පිහිටි ශ්‍රී ලංකා වරාය අධිකාරිය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A/61/2023 දරන හා 2025.07.22 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් ඩබ්. ඒ. ඒ. චමින්ද මයා වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20 (1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A/61/2023 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2026.09.21 දින සිට අවසන් වන බවට පනතේ 20(2) (ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

එච්. එම්. ඩී. එන්. කේ. වටලියද්ද,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2026 මාර්තු මස 31 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව
කොළඹ 05.

**පළමුවන උපලේඛනය**

(3 වන නියෝගය)

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

බේරුම්කරුවකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම.

ලිපිනය :- අංක : 94/41, ගැමුණු මාවත, මිනුවන්ගොඩ.
(නඩුව පවරන විට ලිපිනය :-64/5A, ගම්මැද පාර, මාතම්මන, මිනුවන්ගොඩ)
දිනය :- 2025.11.10

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය.

2025.09.22 දිනැති අංක 2455/02 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද්දා වූ ද ඩබ්. ඒ. ඒ. චමින්ද මයා සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය බැඳී සිටින්නා වූ ද 2025.07.22 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

ජේ. එම්. එන්. ප්‍රියංගිකා ජයකඩු
(ඩබ්. ඒ. ඒ. චමින්ද පළමු පාර්ශ්වකරුගේ
ඇටෝර්නි බලකරු)

පිටපත:- ශ්‍රී ලංකා වරාය අධිකාරිය, අංක 19, චෛත්‍ය පාර, කොළඹ 01.

---

(1) ප්‍රතික්ෂේප කරන පාර්ශ්වය, වෘත්තිය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශ්වයකටම, වෘත්තිය සමිතියකට, සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම් යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20 (1) වන වගන්තිය බලන්න)

(2) දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශ්වයක්, සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශ්වයක්, සේවායෝජකයකු වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග ද වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුය.

EOG 04 - 0211

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.